**බුත්තල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 24 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බුත්තල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂයට, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ සහ ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුම් ශේෂවල එකතුව සමාන විය යුතු වුවද එම ශේෂ 02 ක අතර රු.10,020,000 ක වෙනසක් පැවතුණි. | අදාල ගිණුම් වල ශේෂයන් සමාන විය යුතුවේ. | 2013 මූල්‍ය ප්‍රකාශනවල දෝෂයක් වන අතර 2019 මූල්‍ය ප්‍රකාශනවල ජ'නල් සටහන් මගින් නිවැරදි කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම රු.5,600,780 ක් වුවද එය රු. 2,675,405 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුම් පිළියෙල කිරීමෙන් පසුව උපලේඛන ලැබීම නිසා වෙනස සිදුවී ඇති අතර, 2019 මූල්‍ය ප්‍රකාශනවල අංක 52 දරන ජ'නල් සටහනින් නිවැරදිකර ඇත. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුද්දර ගාස්තුව රු.4,768,916ක් වුවද, එය රු.1,820,642 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුම් පිළියෙල කිරීමෙන් පසුව උපලේඛන ලැබීම නිසා වෙනස සිදුවී ඇති අතර, 2019 මූල්‍ය ප්‍රකාශනවල අංක 52 දරන ජ'නල් සටහනින් නිවැරදිකර ඇත. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.4,130,147 ක් වුවද එය රු.4,025,468 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම් පිළියෙල කිරීමෙන් පසුව උපලේඛන ලැබීම නිසා වෙනස සිදුවී ඇති අතර 2019 මූල්‍ය |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රකාශනවල අංක 52 දරන ජ'නල් සටහනින් නිවැරදි කර ඇත. |
| (v) | සමාලෝචිත වර්ෂය තුලදී දරා තිබුණු රු. 475,469 ක් වූ ප්‍රාග්ධන වියදම් අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | උපකරණ වැය වැරදි ලෙස සටහන් වී ඇති අතර, ඉදිරියේදි නිවැරදි කරමි. |
| (vi) | සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර කුලියට දීම වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී අයවී තිබුණු රු.253,481 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ද ණයගැති ප්‍රතිපාදන ඇතිකර තිබීමෙන් ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි. එමෙන්ම ඊට අදාල බැර සටහන පිළිබඳ විස්තර ද ඉදිරිපත් නොකෙරුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනයේ අංක 53 දරන ජ'නල් සටහනින් නිවැරදි කර ඇත. |
| (vii) | සමාලෝචිත වර්ෂය සඳහා රු. 46,475 ක වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | මගහැරීමේ දෝෂයක් නිසා ණය හිමියන් අඩුවෙන් දක්වා ඇති අතර, 2019 මූල්‍ය ප්‍රකාශනවල අංක 54 ජ'නල් සටහන මගින් නිවැරදි කර ඇත. |
| (viii) | සමාලෝචිත වර්ෂය අවසානයේදී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් සඳහා රු.25,389 ක් වැඩියෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනවල අංක 55 ජ'නල් සටහන මගින් නිවැරදි කර ඇත. |

(ආ) <u>නොසැසඳුනු පාලන ගිණුම්</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ------------------------ | ----------- | ------------------------------------ |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සහ ලේඛනවල දැක්වෙන ව්‍යාපාර/ කර්මාන්ත බදු, වෙළඳ බලපත්‍ර හා හිඟ ජල ගාස්තු ශේෂ අතර රු. 68,054 ක වෙනසක් පැවතුණි. | ලේඛන හා උපලේඛන නිවැරදිව යාවත්කාලීනකර නොසැසඳීම්වලට හේතු සොයා බලා නිවැරදි කළ යුතුවේ. | නිලධාරින්ගේ රාජකාරි විෂයන් මාරු කිරීමත්, ලේඛනවල ආදායම් සටහන් නොකිරීමත් නිසා වෙනස සිදුවී ඇත. |

**(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 2,513,581 ක වත්කම් විෂයකට අදාලව කාල විශ්ලේෂණ සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු. 17,379,437 ක ශේෂයට අදාලව ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරියේදි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කරන අතර ඉල්ලුම් කළද ශේෂ සනාථන මේ දක්වා එවා නොමැත. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| | වරිපනම් බදු පැනවීමකට යටත් ස්ථානයක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | මේ දක්වා වාර වාර්තා කැඳවීම් නොකළ අතර ඉදිරියේදී කැඳවීම් කරමි. |
| (i) 139 වගන්තිය | | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | |

| | | |
|---|---|---|
| (ii) 158,162 හා 163 වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 2,513,581 ක වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | 2019.04.30 දිනට රු. 374,342 ක් අයවී ඇති අතර හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,208,783 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,022,021 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 2,219,792 | 2,231,792 | 1,294,043 | 937,749 | 2,283,220 | 2,187,505 | 1,508,723 | 678,782 |
| (ii) | කුලී | 6,041,600 | 6,730,946 | 6,581,511 | 149,435 | 5,860,800 | 5,709,700 | 5,536,200 | 173,500 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,141,000 | 1,570,772 | 1,570,772 | - | 1,174,000 | 1,174,559 | 1,174,559 | - |
| (iv) | වෙනත් ආදායම් | 29,473,500 | 22,224,707 | 15,080,568 | 7,144,139 | 18,840,640 | 22,584,464 | 14,993,616 | 7,590,848 |
| | එකතුව | 38,875,892 | 32,758,217 | 24,526,894 | 8,231,323 | 28,158,660 | 31,656,228 | 23,213,098 | 8,443,130 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු. 32,758,217 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 8,231,323 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කල ආදායමෙන් සියයට 25 ක් විය. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | හිඟ ආදායම් තුල උසාවි දඩ හා මුද්දර ගාස්තු රු. ලක්ෂ 37 ක් අයවීමට ඇති අතර හිඟ වරිපනම් බදු දේපළ තහනම් කර අය කරමි. ලැබිය යුතු යන්ත්‍ර කුලිය රු.ලක්ෂ 29 ක් ඇත. |

### 2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු අයකිරීමට අදාල දේපල වසර 5 කට වරක් තක්සේරු කළයුතු වුවද 2007 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබුණි. | වසර 5 කට වරක් දේපල තක්සේරු කළ යුතු වේ. | 2016.07.27 දින සිට නැවත තක්සේරු ආරම්භ කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු.2,604,697 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු.1,581,832 ක් හෙවත් සියයට 61 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | ඉදිරියේදී දේපළ තහනමට ගැනීමේ කටයුතු සිදු කරන බවත් රජයේ දේපළ සම්බන්ධයෙන් තීරණ ගැනීමට සභාවට ඉදිරිපත් කරන බවත් දක්වා ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.1,980,725 ක් වූ වරිපනම් බදු ආදායමින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 931,749 ක් හෙවත් සියයට 47 ක් රැස්කර නොතිබුණි. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | ඉදිරියේදී දේපළ තහනමට ගැනීමේ කටයුතු සිදු කරන අතර රජයේ දේපළ සම්බන්ධයෙන් තීරණ ගැනීමට සභාවට ඉදිරිපත් කර ඇත. |

**2.2.4** ජල ගාස්තු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයකට අධික කාලයක සිට අය නොවී පවතින ජල ගාස්තු ආදායම් ශේෂය රු.408,099 ක් විය. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | විසන්ධි කරන ලද ජල සැපයුම්වල රු.38,000 ක හිඟයක් පවතින අතර ඉතිරි හිඟ මුදල් අයවෙමින් පවතී. 2019.03.31 දිනට හිඟය රු.75,510 ක් වේ. |

**2.2.5** ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු ප්‍රචාරක දැන්වීම් පුවරු 343 කින් ඉකුත් වර්ෂය වෙනුවෙන් රු. 410,900 ක් සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 2,097,931 ක් වශයෙන් එකතුව රු. 2,508,831 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකරගත යුතුවේ. | අදාල ආයතන වෙත මුදල් ගෙවන ලෙස දන්වා ලිපි යවා ඇත. |

**2.2.6** දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බලප්‍රදේශයේ ස්ථාපනය කර ඇති ආයතන 02 කට අයත් සම්ප්‍රේෂණ කුළුණුවලට අදාලව වර්ෂයකට වඩා වැඩි හිඟ ශේෂය රු. 141,000 ක් සහ සමාලෝචිත වර්ෂයට අදාල රු. 6,000 ක ගාස්තු අයකර නොතිබුණි. | හිඟ දුරකතන සම්ප්‍රේෂණ කුළුණු ආදායම් අයකරගත යුතුවේ. | වසර ගණනක සිට පවතින හිඟයක් වන අතර රු. 33,000 ක් මේ වන විට අයවී ඇත. |

**2.2.7** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු උසාවි දඩ රු.1,997,877 ක් හා මුද්දර ගාස්තු රු.1,820,642 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ මුදලින් රු. 981,640 ක් ලැබී ඇති අතර 2018 ජූලි සිට සැප්තැම්බර් දක්වා මාසවලට අදාලව රු. 1,820,642 ක මුද්දර ගාස්තු මුදල ලබා ගැනීමට උපලේඛන සකසා 2019.03.08 දින පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යවා ඇත. |

**2.3** අධිභාර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැනවූ අධිභාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.733,241ක මුදලක් අයකරගත යුතුව පැවතුණි. | හිඟ අධිභාර අය කර ගත යුතුවේ. | අධිභාර අයකිරීම පළාත්පාලන දෙපාර්තමේන්තුවෙන් කරන අතර, අධිභාර ගෙවන ලෙස නියෝග ලබා දී ඇත. |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉන් කාරණා 20 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අංක 1816/43 හා 2013.06.28 දිනැති ගැසට්පත්‍රය පළකොට අතුරු ව්‍යවස්ථා 23 න් 21 ක් වැළඳගෙන ඇති අතර 10ක් ගැසට්කර ඇත. |

**(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී සිව් අවුරුදු සැලැස්මක් සකස් කරමි. |

**(ඇ) <u>ඉටුනොකල කර්තව්‍යන්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ව්‍යාපෘති 24 ක් ඉටුකිරීමට රු. 18,120,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද කිසිදු ව්‍යාපෘතියක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මකකර නොතිබුණි. | වාර්ෂික අයවැය ලේඛනය මගින් සැලසුම්කර ඇති ව්‍යාපෘතීන් වර්ෂය තුල ක්‍රියාත්මක කළ යුතුවේ. | කර්මාන්ත කිහිපයක කටයුතු 2019 වසරේදි ඉටු කරන බව දන්වමි. |

**(ඈ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු 2012 වර්ෂයේදී ආරම්භ කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ සඳහා පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍රය ලබාගත යුතුවේ. | පරිසර බලපත්‍රය 2019 දී ලබා ගැනීමට කටයුතු කරමි. |

**(ඉ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීමට ඉදිරියේදි සාකච්ඡා කර ක්‍රියාමාර්ග ගනිමි. |

| | | |
|---|---|---|
| අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | |

**3.2** <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක 2050 දරන 2017 දෙසැම්බර් 15 දිනැති ගැසට් පත්‍රය මගින් සභාව විසින් බුත්තල, පැල්වත්ත හා ඔක්කම්පිටිය නගරවල ඇති රථ වාහන නැවතුම් ස්ථානවලින් ගාස්තු අය කිරීමට ප්‍රසිද්ධ කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම ගාස්තු අයකර ගෙන නොතිබුණි. | රථගාල් ගාස්තු අයකර ගත යුතුවේ. | අදාල අතුරු ව්‍යවස්ථාව 2018 දෙසැම්බර් මස සභා සම්මත කර ඇති අතර ගැසට්කර ගාස්තු අයකිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාවට අයත් යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් 2010 වර්ෂයේ සිට අයවිය යුතු රු. 6,589,590 ක ශේෂයක් විය. | හිඟ යන්ත්‍ර කුලී අය කර ගත යුතුවේ. | මේ වන විට හිඟ ආදායමින් රු. ලක්ෂ 5 ක් අයකර ගෙන ඇත. |
| (ඇ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට සහ වෙනත් ආයතන හා පුද්ගලයින් 11 කට 2016 වර්ෂයට අදාලව රු. 130,721 ක් සහ ඉකුත් වර්ෂයට අදාලව රු. 2,604,773ක් වශයෙන් එකතුව රු. 2,735,494 ක් වූ ණය වාරික හා ගෙවිය යුතු මුදල් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල්කර නොතිබුණි. | ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ශේෂයෙන් රු. 612,215 ක් 2019 දී ගෙවා ඇත. හිඟ ආදායම් රැස්කිරීමෙන් පසුව අනෙකුත් ගෙවීම් කරන අතර යන්ත්‍රෝපකරණ ගිණුමට මුදල් ලැබුණ විගස හිඟ වාරික ගෙවීමට කටයුතු කරමි. |

**3.3** <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>කාර්ය මණ්ඩල තොරතුරු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 03කට අදාලව සේවකයන් 07 දෙනෙකුගේ අතිරික්තයක්ද තනතුරු 7 කට අදාලව | අතිරික්ත කාර්ය මණ්ඩල තනතුරු අනුමත කර ගැනිමත් පුරප්පාඩු | වාර්ෂික ස්ථානමාරුවීම් හේතුවෙන් අතිරික්තයක් ඇති වී ඇති අතර ඒ පිළිබඳව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් දැනුවත් කර පුරප්පාඩු පිළිබඳව සෑම |

| | | |
|---|---|---|
| සේවක පුරප්පාඩු 15 ක් පැවතුණි. | සම්පූර්ණ කරවා ගැනීමටත් කටයුතු කළයුතුවේ. | මසකම පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා ඇත. |

(ආ) <u>සේවක ණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ සේවය කළ සේවකයින් 27 දෙනෙකුට ලබාදී තිබුණු වර්ෂ 1 කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින ණය ශේෂය රු. 249,876 ක් විය. | හිඟ සේවක ණය අයකර ගත යුතුවේ. | මරණ පාරිතෝෂිත වලින් අයකරගන්නා අතර, අයකල නොහැකි ශේෂ පිළිබදව විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරමි. |

## 3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) <u>බදු කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 සිට 2012 වර්ෂය දක්වා සභාවට අයත් සතිපොළ, ගවමස් කඩ, එළුමස් කඩ හා කුකුල් මස් කඩ බදුදීම වෙනුවෙන් රු. 1,225,279 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු කුලී අයකරගත යුතුවේ. | 1988-2011 කාලයට අදාල ඒවා කාලීනව අය නොකිරීම නිසා මේ වන විට අයකර ගැනීම ගැටළු සහගත වී ඇත. |

(ආ) <u>ඉවත්කළ කඩවල කුලී</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත්ව තිබුණු ඉවත් කරන ලද පැරණි කඩකාමර 14 කින් රු. 190,054 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ කඩකාමර කුලී අයකරගත යුතුවේ. | කඩකාමර ඉවත්කරන අවධියේ කඩකුලී අය නොකල නිසා මේ වන විට අය කිරීමට නොහැකි අතර නව කඩකාමර ලබාදුන් විට කඩහිමියන්ගෙන් අයකිරීමට කටයුතු කරන ලෙසට නඩු තීන්දුවක් ලබාදී ඇත. |

**3.5** <u>වත්කම් කළමනාකරණය</u>

**(අ)** <u>නිශ්ක්‍රීය වත්කම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2004 පෙබරවාරි 10 දින සභාවට ලැබී තිබුණු රු. 300,000 ක් වටිනා මිනි ට්‍රැක්ටරය භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | ට්‍රැක්ටරය ක්‍රියා විරහිත වී ඇති බැවින් ඉදිරියේදී අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරමි. |

**(ආ)** <u>වාහන උපයෝජනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සභාවට අයත් වාහන 17 ක ඉන්ධන දහනය පරීක්ෂාකර නොතිබුණි. | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතුවේ. | ඉන්ධන දහනය පරීක්ෂාව ජූලි මස සිදු කිරීමට කටයුතු කරමි. |

**3.6** <u>ප්‍රසම්පාදනය</u>

**3.6.1** <u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | අනුමත වාර්ෂික අයවැය ලේඛනයට අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයට ප්‍රසම්පාදන සැලැස්මක් කෙටුම්පත් කර ඇත. |

### 3.6.2 කර්මාන්ත පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------------------- | ------------------- | ------------------------------- |
| (අ) | සභා බලප්‍රදේශයේ මාර්ග 36ක් සකස්කිරීමට සභාවට අයත් මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර 02 මීටර් පැය 286ක් ධාවනයකර තිබුණද මෙම කර්මාන්ත සඳහා ඇස්තමේන්තු සකස්කර නොතිබුණු අතර සංවර්ධනය කළ මාර්ග පිළිබඳ විස්තරද විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේම මෙම කර්මාන්ත සඳහා නිම්වැඩ වාර්තාද සකස් කර නොතිබුණි. | එක් එක් කර්මාන්තය සඳහා ද්‍රව්‍ය, ශ්‍රමය, යන්ත්‍රපැය ඇස්තමේන්තු සකස්කර කාර්මික නිලධාරී අධීක්ෂණය යටතේ සිදුකර අවසානයේ නිම් වැඩ වාර්තා සකස් කළ යුතුය. | ඉදිරියේදී සිදු කරනු ලබන පොදු සංවර්ධන කටයුතු සඳහා ඇස්තමේන්තු සකස්කර කාර්මික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ නියමිත පිරිවිතර ඇද්දැයි පරීක්ෂා කර බලා නිම් වැඩ වාර්තා ලබාගෙන ලිපිගොනු සකස් කරන බව දන්වමි. |
| (ආ) | බුත්තල පොදු වැසිකිළිය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | පෙට්ටි වැසිකිලි පෝච්චි (commode) 2 ක් සවිකිරීම සඳහා රු.26,860ක් වැඩිපුර ගෙවා තිබුණු අතරම ඒවා පිළිගත් ගුණාත්මක තත්ත්වයේද නොපැවතුණි. | නිවැරදිව ඇස්තමේන්තු සකස්කර, පරීක්ෂාකර ගෙවීම් කළ යුතු අතර, සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | BSR රේට් අනුව රු.13,776ක රේටයක් ඇතුළත්ව තිබුණද විවෘත වෙළඳපොල මිල ගණන් අනුව මිලදී ගෙන කොමඩ් සවිකර ඇත. ඇස්තමේන්තු සකස් කිරීමේදි එය අතපසු වීමකින් යොදා ඇති අතර, එය වෙළඳපොල මිල ලෙස නිවැරදි විය යුතුය. ඉදිරියට මෙවැනි ඇස්තමේන්තු වෙනස්වීම් වෙනම ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා බවත් දන්වමි. |
| (ii) | බිල්පත්‍රය අනුව වැඩ විෂය අංක 02 අනුමත ගුණාත්මකභාවයේ වැසිකිලි පෝච්චි (Approved Quality Ceramic Squating Pan) 04 ක් සවි කිරීම සඳහා ගෙවීම්කර තිබුණද ඒවා අනුමත ඒවා නොවන බව නිරීක්ෂණය විය. සවිකර තිබුණු වැසිකිලි පෝච්චි (squating pan) සියල්ල කැඩී ගොස් තිබුණු බවද නිරීක්ෂණය විය. | ගෙවීම් සිදු කිරීමට පෙර අදාළ කාර්යන් ඇස්තමේන්තුවේ සඳහන් පරිදිම ඉටු කර තිබේදැයි පරීක්ෂාකළ යුතු අතර, සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | අනුමත වැසිකිළි පෝච්චි සවිකර තිබුනද පාවිච්චි කිරීමේදි විවිධ පුද්ගලයින් විසින් විධිමත් පරිදි පාවිච්චි නොකිරීම නිසා කැඩී ගොස් ඇති බව දන්වමි. |
| (iii) | ඉකුත් වර්ෂයේ සවිකර තිබුණු | වගකිවයුතු පාර්ශව | මේ සම්බන්ධව ඉදිරි පරීක්ෂණ කර |

| | | | |
|---|---|---|---|
| | රු.37,073ක් වටිනා සේදුම් කාමර උපාංග අස්ථානගතවී තිබුණි. | හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | විගණනයට වාර්තා කරන ලෙස උපදෙස් දී ඇත. |
| (ඇ) | රත්වත්ත මාවත මාර්ගය දෙපස බොරළු දමා සැකසීමේ කර්මාන්තයට අදාලව මාර්ග තලය සම්පිණ්ඩනය කිරීම සඳහා ජලය යෙදීමේදී රු. 39,803ක් වැඩිපුර ගෙවා තිබුණි. | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | බොරළු දමා සැකසීමේදි ඝන මීටර් 163.93 ක් ජලය දමා තැලීමට සිදු වූ අතර එම දිනවල අධික නියඟයක් තිබූ බැවින් අනුමත ප්‍රමාණයට වඩා ජලය දැමීමට සිදු විය. ඒ සම්බන්ධයෙන් කාර්මික නිලධාරින් විසින් සටහන් තබාගෙන ගෙවීම් කල අතර, ඉදිරියට බිල්පතේ සටහන් තබා ගෙවන ලෙස කාර්මික නිලධාරිට උපදෙස් ලබා දුනිමි. |
| (ඉ) | සභාව විසින් ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයක බොරළු යොදා ඉදිකර තිබුණු මාර්ග සංවර්ධන ව්‍යාපෘති 8 කට අදාළව ප්‍රවාහන විෂයය සඳහා ගෙවීම් කිරීමේදී බොරළු ඝන මීටර් 200 කට වැඩි ප්‍රමාණයේ ගෙවීම් ප්‍රමාණ රේට යොදා නොගෙන ඝන මිටර් 200 ට අඩු රේට යොදාගෙන ගෙවීම් කිරීම නිසා රු. 434,630 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සභා අරමුදලට සිදුවී ඇති පාඩුව නැවත අයකර ගත යුතුවේ. | මෙම කර්මාන්තවල බොරළු ප්‍රවාහනය සඳහා මාර්ග මිලගණන් වල අවසානයේ සඳහන් මිල ගණන් භාවිතා කර ඇති අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරමි. |

**4.** <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

**4.1** <u>අයවැය පාලනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තු කළ ආදායම් හා වියදම්, වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 7ක සියයට 11 සිට සියයට 100 දක්වාද වියදම් විෂයයන් 9 ක සියයට 16 සිට සියයට 100 දක්වාද විචලනයන් පැවතුණි. | තාත්වික අයවැය ලේඛනයක් පිළියෙල කර දක්වා ඇති ඉලක්ක සපුරාගත යුතුවේ. | වාර්ෂිකව අයවැය ලේඛනයක් පිළියෙල කලද කටයුතු කරගෙන යෑමේදි වෙනස් වන බාහිර පරිසර තත්ත්වයන් යටතේ ඇස්තමේන්තුගත කාර්යන් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථා ඇති වන අතර එම බලපෑම් නිසා අයවැය විචලනයන් ඇති වේ. එවැනි අවස්ථා පරිපූරක ඇස්තමේන්තු මගින් අනුමත කරගෙන ඇත. |

## 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවෙහි 2009 ජුනි 9 දිනැති අංක ඩීඑම්ඒ/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටු විය යුතුවේ. | 2018 වර්ෂය සඳහා පළාත්පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදී, දිස්ත්‍රික්කයේ සියළුම පළාත් පාලන ආයතන ආවරණය වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්කර ඇත. |